**දික්වැල්ල ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**-------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයට අදාළව 2016 වර්ෂයේ ලැබී තිබූ රු.1,022,982 ක් වූ ප්‍රාග්ධන ආධාර වටිනාකම සහ රු.1,379,276 ක් වූ හිඟ වැටුප් ප්‍රතිපූර්ණයවීම් වර්ෂයේ අතිරික්තයට ගලපා තිබුණද, එම මුදල සමුච්චිත අරමුදලින් ඉවත් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයන්හි සභා අරමුදල් සහ විවිධ ප්‍රතිපාදන යටතේ කර තිබූ ඉදිකිරීම්වලට අදාළ එකතු වටිනාකම රු.4,254,494 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) සභාව සතු එක්ස්කැවේටර් යන්ත්‍රය වෙනුවෙන් ඉකුත් වර්ෂයේ වියදම් කර තිබූ ප්‍රාග්ධන වියදම රු.207,300 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාව වෙත පවරාදී තිබූ රු.15,995,151 ක් වූ සීතගල්ල මුහුදු තටාංගනය සහ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.535,000 ක් වූ ජල බවුසරයෙහි වටිනාකම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් සහ විවිධ ප්‍රතිපාදන යටතේ නිමකර තිබූ ඉදිකිරීම්වලට අදාලව එකතුව රු.2,459,224 ක් වූ ස්ථාවර වත්කම් හා මිලට ගෙන තිබූ එකතුව රු.153,565 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) එකතුව රු.95,967 ක් වූ සේවක ඇප තැන්පත්වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(උ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය මුදල රු.4,930,120 ක් අඩුවෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබූ අතර ශේෂය ජංගම සහ ජංගම නොවන වගකීම් ලෙස වෙන් වෙන්ව හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි ණයහිමි ප්‍රතිපාදන සලසා තිබූ කර්මාන්ත 13ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදීද රු.14,638,081 ක ප්‍රතිපාදන ඇති කර තිබුණි.

(එ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි ණයගැති ප්‍රතිපාදන සලසා තිබූ කර්මාන්ත 11ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී නැවත රු.15,663,566 ක ප්‍රතිපාදන ඇති කර තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයේ නිමකර තිබූ කර්මාන්ත 03 ක ණයහිමි ප්‍රතිපාදන රු.1,661,202 ක් හා ණයගැති ප්‍රතිපාදන රු.2,986,853 ක් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඔ) හිඟ වරිපනම් බදු ශේෂය වෙනුවෙන්, සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන තිබූ රු.131,397 ක දඩ ගාස්තු මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) ඉකුත් වර්ෂයේදී සභාව සතු ටිපර් රථය කුලී පදනම මත ලබාදීම වෙනුවෙන් අයවිය යුතු රු.56,810 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ක) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.2,345,097 ක දායක මුදල වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ජ) මාර්ග සංවර්ධනය කිරීමේ කර්මාන්තයක වියදමට අදාළ කර්මාන්ත ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන රු.69,181 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂය අවසානයට ණය ගිණුමේ ශේෂය හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂය අතර වූ රු.569,149 ක වෙනස හඳුනා ගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

-----------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 397,207,953 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.261,374,970 ක අසමානතා පවතින බව නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට විවිධ ණයගැති ශේෂය රු.56,028,742 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.27,328,904 ක ණයගැති ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

---------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අවසානයට කර්මාන්ත ණයහිමි ශේෂය රු.142,687,232 වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ එකතුව රු.113,831,161 ක් වූ ශේෂ ඇතුළත් වී තිබුණි.

(ii) රු. 53,194 ක් වූ නිශ්චිත බදු තැන්පතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 559,723,679 ක්වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

-------------------

### 1.3.5.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව එකතු කර ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. |
| (ii) රීති 164 | සභාවේ ගිණුම් ලියකියවිලි ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දිනපතා පරීක්ෂා |

| | | |
|---|---|---|
| | | කර ඒ බවට කෙටි අත්සන් තබා තහවුරු කර නොතිබුණි. |
| (ආ) | 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය | භාවිතයෙන් ඉවත් කර තිබූ පිරිවැය රු.2,350,000 ක් වටිනා වාහන 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතබුණි. |
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද 1992 පෙබරවාරි 26 දිනැති අංක 05/01/119/විix දරන උපදෙස් ලිපිය | සැළසුම් කමිටු දීමනාව ගෙවීම සඳහා පැය 02 කට වැඩි කාලයක් රාජකාරි වේලාවෙන් බැහැරව කටයුතු කළ යුතු වුවද, ඊට අදාළ නොවන අයුරින් රු.288,000 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි. |
| (ඈ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2016 දෙසැම්බර් 31 දිනැති දපස/සං/01/01/53 දරන උපදෙස් ලිපිය | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවී රු.8,723,757 ක් වූ කර්මාන්ත 13 ක් වෙනත් කොන්ත්‍රාත්කරුවන් ලවා ඉටු කර ගෙන තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,632,502 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,068,210 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,697,123 | 5,805,656 | 5,966,523 | 2,498,500 | 4,404,905 | 4,455,407 | 3,445,618 | 2,659,367 |
| කුලී | 4,996,100 | 4,688,694 | 4,566,433 | 1,783,182 | 5,457,700 | 4,860,777 | 4,638,330 | 1,660,921 |
| බලපත්‍ර ගාස්තු | 1,136,000 | 1,292,591 | 1,292,591 | - | 857,500 | 1,204,829 | 1,204,829 | - |
| වෙනත් ආදායම් | 31,414,735 | 33,870,641 | 11,245,403 | 69,254,288 | 19,857,343 | 29,114,283 | 15,279,491 | 46,629,050 |
| -එකතුව- | 41,243,958 | 45,657,582 | 23,070,950 | 73,535,970 | 30,577,448 | 39,635,296 | 24,568,268 | 50,949,338 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු. 41,243,958 ක් වූ අතර බිල් කළ ආදායම රු.45,657,582 ක් විය. රු.50,949,338 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.96,606,920 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.23,070,950 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.73,535,970 ක් වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වරිපනම්

----------

ආරම්භක හිඟ ශේෂය රු.2,894,613 ක් වූ අතර, රු.3,449,234 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.6,343,847 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.3,582,335ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.2,632,926 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) අක්කර බදු

-----------

ආරම්භක හිඟ ශේෂය රු.51,348 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.6,902 ක් විය. වර්ෂය තුළ මුළු අයවීම් රු.4,308 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.53,942ක් හිඟව පැවතුණි.

### 2.2.4 කුලී

-----

ආරම්භක හිඟ කඩ කුලී ශේෂය රු.1,658,921 ක් වූ අතර, රු.2,385,302 ක් වූ බිල්කිරීම් සමග රු.4,044,223 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු. 2,571,436 ක් වූ නිසා, වර්ෂය අවසානයට රු.1,472,787 ක් හිඟව පැවතුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

----------------

සභාව විසින් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ව්‍යාපාර ස්ථාන 11 කින් අයවිය යුතු රු.43,000 ක වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,948,198 ක් හා මුද්දර ගාස්තු රු.67,306,090 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිලිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් රු.11,686,778 ක වියදම් දරා තිබුණි. වර්ෂය තුළ කසළ කිලෝග්‍රෑම් 514,434ක් එකතු කර තිබුණ අතර කසළ එකතු කිරීමෙන් ලද ආදායම රු1,123,600 ක් විය. දිරන කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා සහ ජීවවායු ඒකකය සඳහා යොදාගෙන, නොදිරන කසල පෞද්ගලික ඉඩමකට බැහැර කර තිබුණි. ඒ සඳහා පරිසර ආරක්ෂක බලපත්‍රය ලබාගෙන නොතිබුණි. ජීව වායු ඒකකය අක්‍රීය වී තිබුණි.

#### (ආ) පාරිසරික ගැටළු

-------------------

1980 අංක 47 දරන ජාතික පරිසර පනත අනුව නිකුත් කළ 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති ගැසට් නිවේදනය අනුව බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර ආයතන 66 ක් පරිසර බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට රු.290,400 ක ආදායමක් අහිමි වී තිබුණි. තවද එමඟින් සිදුවන පරිසර හානිය පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

#### (ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණි. තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබු අතර, අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. තිරසර සංවරධන ඉලක්ක ළඟා කර ගැනීම සභාවේ දැනට පවතින භෞතික සම්පත් කළමනාකරණය සඳහා ක්‍රමවේදයක් සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයක් සහ අවශ්‍ය සම්පත් හා ධාරිතාවයක් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීමේ අවදානම හඳුනාගෙන නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

ඉකුත් වර්ෂයේදී මාතර කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතිය සඳහා කුලී පදනම මත ටිපර් රථයක් ලබාදී තිබූ අතර ඉන් අයවිය යුතු රු.56,810 ක මුදල 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා

-----------------------------------

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කෙරේ.

(i) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයන් 16 ක් බඳවාගෙන තිබූ අතර සේවක පුරප්පාඩු 02 ක් ද පැවතුණි.

(ii) භාණ්ඩාගාර ලේකම්ගේ 2014 මාර්තු 31 දිනැති අංක 3/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි බඳවාගෙන තිබූ සේවකයන් 15 දෙනෙකු වෙනුවෙන් 2014 වර්ෂයේ සිට රු.6,400,866 ක මුදලක් වැටුප් වශයෙන් සභා අරමුදලින් ගෙවා තිබුණි. ඉන් 2017 වර්ෂය තුළ පමණක් රු.3,058,834 ක මුදලක් ගෙවා තිබුණි.

**(ආ) සේවක ණය**

-------------

සභාවේ සේවක ණය ලේඛනය අනුව වාරික ගෙවීම් පැහැර හැර ඇති සේවකයින්ගෙන් අයවිය යුතු රු. 381,136 ක්වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------**

(අ) සමාලෝචිත වර්ෂය තුළ වීථි පහන් 3000 ට වැඩි ප්‍රමාණයක් නඩත්තු කිරීම වෙනුවෙන් රු.607,893 ක මුදලක් වැයකර තිබූ අතර, අනුමත විථි පහන් සංඛ්‍යාව වූ 308 ක ප්‍රමාණය ඉක්මවා වීථි පහන් යෙදීම නිසා සභා අරමුදලින් රු.523,813 ක මුදලක් නඩත්තු කටයුතු සඳහා වැය කිරීමට සිදුවී තිබුණි.

(ආ) කරඳගොඩ කීනගහහේන කිරිමැටි වත්ත නැමැති ඉඩම වෙන්දේසි කිරීමේදී සභාවට අයවිය යුතු බිම් ප්‍රමාණය රූඩ් 2 පර්චස් 0.32 ක් අඩුවෙන් ලබාදී තිබූ අතර අදාළ ඉඩම පිළිබඳ සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී සභාවට හිමි ඉඩම් කොටස හඳුනාගැනීමට ද නොහැකි විය.

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් රු.2,000,000 ක් වූ ලොරි රථයක් 2014 සැප්තැම්බර් 16 දින සිටද, රු.350,000 ක් වූ ට්‍රේලරය හා වටිනාකම සඳහන් නොවූ තවත් යතුරුපැදියක් 2016 දෙසැම්බර් 09 දින සිට අක්‍රිය වී තිබුණි.

(ආ) 2011 නොවැම්බර් 30 දින මිලදී ගෙන තිබූ බැකෝ යන්ත්‍රය 2017 දෙසැම්බර් 31 දින වන විට යන්ත්‍ර පැය 147.5 ක් පමණක් කුලී පදනම මත මෙන්ම සභාවේ කටයුතු සඳහා සේවයේ යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී රු.166,860 ක ආදායමක් උපයාගෙන තිබුණ නමුත්, රු. 1,580,983 ක අලුත්වැඩියා සහ ඉන්ධන වියදම් දරා තිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව විවිධ ප්‍රතිපාදන යටතේරු.4,000,000 ක් වූ වැඩ යෝජනා 08 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර අයවැය ලේඛනය යටතේ ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු රු.12,967,091 ක් වූ කර්මාන්ත 11 ක් විවිධ ප්‍රතිපාදන යටතේ ඉටු කිරීමට කටයුතු කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 06 ක එකතුව රු.20,671,431 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම් සියයට 18 සිට 57 අතර පරාසයක පැවතුණි.

(ආ) තවත් වියදම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.1,029,160 ක් වූ අතර, එම වටිනාකම් සියයට 03 සිට සියයට 1913 අතර පරාසයක පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 03ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 2,982,075 ක් වූ අතර, එම වටිනාකම් සියයට 06 සිට සියයට 19 අතර පරාසයක පැවතුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමඟ සාකච්ඡා කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 4.3 නොවිසඳි ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

---------------------------------------------------------------------

පහත සඳහන් විගණන විමසුම්වලට අදාළව 2017 දෙසැම්බර් 31 දින දක්වා අදාළ පියවර ගෙන නොතිබුණි.

(අ) කසල එකතු කිරීම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලැබී තිබූ රු.2,566,550 ක මුදලින් රු.861,434 ක මුදලක් කොමිස් මුදල් ලෙස සභාවේ සෞඛ්‍ය සේවකයින්ට ගෙවා තිබුණි.

(ආ) සභාවට අයත් ආදාහනාගාරයක් ඉදිකිරීමට අදාල නඩුව සමථයකට පත් කර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම නඩුව පවත්වාගෙන යාම නිසා 2010 වර්ෂයේ සිට 2016 වසර දක්වා නඩු ගාස්තු වෙනුවෙන් රු.427,500 ක මුදලක් සභා අරමුදලින් ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් 07 කින් බදු මුදල් අයකර නොතිබුණි. එසේ බදු අය නොකිරීම නිසා හෝටල් 03 කින් පමණක් සභාවට රු. 1,535,860 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) සභාවට අයත් පොළ භූමියේ ජීව වායු ඒකකයක් ඉදිකිරීම වෙනුවෙන් දරා තිබුණු රු.1,010,712 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි.

## 5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් රැස්කිරීම

(ඇ) අයවැය පාලනය

(ඈ) ගිණුම්කරණය